# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්) - 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

01. ගිණුම්කරණය/ අලෙවිකරණය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජවේදී/ ආර්ථික විද්‍යාව පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**හෝ**

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම,

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,
02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයේ II ශ්‍රේණියේ තනතුරක සමාජ ආරක්ෂණය සම්බන්ධව වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය JM 1-1(2016) - රු. 42,600-10X775-18X1,135-70,580ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 42,600.00 වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### 02. සම්බන්ධීකරණ නිලධාරි තනතුරු - 15

**පැවරෙන කාර්යයන්**

මෙම මණ්ඩලය දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මගින් ක්‍රියාත්මක කරන විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවා ගැනීමට අදාළ වැඩසටහන් සකස් කරමින් බඳවා ගැනීම් සිදු කිරීම, අදාළ දැනුවත් කිරීම් ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම, බඳවා ගන්නා ලද සාමාජිකයින් වාරික නියමිත දිනට ගෙවමින් සාමාජිකත්වය සක්‍රියව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම, අදාළ වාරික මුදල් නියමිත දිනට අප්‍රමාදයකින් තොරව මණ්ඩලයට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම හා ප්‍රතිලාභ ගෙවීමට අවශ්‍ය මූලික පරීක්ෂාවන් සහ තීරණ ඉදිරිපත් කිරීම.

**සුදුසුකම්** : අලෙවිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ සංඛ්‍යානය/ සමාජ විද්‍යාව/ සමාජ වැඩ/ ප්‍රජා විද්‍යාව, ඇතුළත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබාතිබීම.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3(2016) - රු. 32,200-10X445-11X660-10X730-5X750-54,960 ක් වේ. බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 32,200.00 වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### 03. විමර්ශන නිලධාරි තනතුරු - 01

**සුදුසුකම්** : වාණිජ්‍ය/ ගිණුම්කරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3 (2016) - රු. 32,200-10X445-11X660-10X730-5X750-54,960 ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 32,200.00 වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### 04. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු - 11

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

(අ). අ.පො. ස සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල/දෙමළ හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06 කින් එකවර සමත්ව තිබීම.

(ආ). අ.පො.ස උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ). පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ", "ඇ" සහ "ඈ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී,

i. සිංහල දෙමළ

ii. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06)කින් සමත්ව තිබීම.

පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඈ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA 1-1(2016) - රු. 27,910- 10X300-7X350 - 4X495 - 20X660 - 48,540.00ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු.27,910.00 වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### 05. රියදුරු 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) කින් සමත් වීම,

**ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම හා රියදුරු බලපත්‍රයක් ලැබීමෙන් පසු රියදුරකු ලෙස වසර 03 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම හා රියදුරු බලපත්‍රයක් ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

**සහ**

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය PL 3(2016) - රු. 26,290 - 10X270 - 10X300-10X330 - 12X350 -39,490.00ක් වේ.

බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 26,290.00 වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### 06. අලෙවි නියෝජිත
### (මෙම තනතුර ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් තනතුරක් නොවේ)

**පැවරෙන කාර්යයන්**

මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවා ගැනීම් කිරීම, අදාළ දැනුවත් කිරීම් ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ බඳවා ගන්නා ලද සාමාජිකයින් අඛණ්ඩව සක්‍රිය තත්ත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

**සුදුසුකම්**

❖ අ.පො.ස.(සා.පෙ) සමත් වීම.

❖ රක්ෂණ හෝ අලෙවිකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

**වයස් සීමාව** : අවුරුදු 18 වැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අදාළ නොවේ.

❖ විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවා ගැනීම සහ වාරික අය කිරීම් මත කොමිස් මුදලක් පමණක් ගෙවනු ලැබේ.

❖ ඔබ කැමති ඕනෑම දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්කයන්හි සේවය කිරීමේ අවස්ථාව ලැබේ.

අලෙවි නියෝජිත තනතුර සඳහා පහත සඳහන් පොදු කොන්දේසි අදාළ නොවේ.

**පොදු කොන්දේසි**

**සෑම ඉල්ලුම්කරුවෙකුම,**

♦ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

♦ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

♦ විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

♦ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සපුරාලීමට හැකියාව තිබිය යුතුයි.

♦ සිංහල, ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂා තුනෙන් හෝ සිංහල/ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂාවන්ගෙන් වැඩ කිරීමේ හැකියාව සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම සහිත අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ල දෙනු ලැබේ.

♦ සුදුසුකම්වලට අදාළ සියලුම සහතිකපත්වල පිටපත් සාමාදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර අයදුම්පත්‍රය සමග එවිය යුතුය.

♦ උපරිම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඉහත 01, 02 හා 03 යන තනතුරුවලට ඉල්ලුම් කරන අයදුම්කරුවන් සඳහා

♦ සිංහල හෝ ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කිරීම් (PowerPoint Presentation) සාර්ථකව සහ ආකර්ෂණීයව කළ හැකි අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ල දෙනු ලැබේ.

♦ 2020 වර්ෂයේ රජයේ උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවාගත් ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලබන අතර, පුහුණුව නොලබන බවට දිවුරුම් ප්‍රකාශයක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

මෙම තනතුරු ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුයි. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. ලිඛිත තරග විභාගයක් හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ. ඉහත පුරප්පාඩු සම්පූර්ණයෙන් පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ඔබගේ අයදුම්පත්‍රය "**සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2021.02.08 දිනට පෙර ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. වැඩිදුර තොරතුරු **www.ssb.gov.lk** වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳරාගම**
**සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස", අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.**

**2021.01.15**